නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව
අනුරාධපුර දිස්ත්‍රික්කය

---

01. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 සැප්තැම්බර් 03 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 18 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය තුළදී දේපළ ඉදිකිරීම් සහ නවීකරණය කිරීම් 05 කට වැය කළ රු.3,476,404 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | සියළු ප්‍රාග්ධන වැය ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ ස්ථාන 48 ක දේපළ බදුදීමේ ආදායම රු.1,448,635 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල රු.2,289,549 ක් ලෙස දක්වා තිබීම නිසා රු.840,914 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ආදායම් නිවැරදිව හඳුනාගත යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

(ආ) නොසැසඳුණු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශන අනුව රු.44,703,832 ක් වූ ගිණුම් ශේෂ 04 ක වටිනාකම උපලේඛන අනුව රු.45,481,487 ක් වූයෙන් රු.1,492,343 ක එකතු වෙනසක් විය. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. | නොසැසඳීම් සොයාබලා නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(i) ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වර්ෂ 05 කට අධික කාලයක සිට අය නොවෙමින් පවතින රු.1,146,420 ක් වූ කර්මාන්ත ණයගැති ශේෂ 17 ක් විය. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |

(ii) ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| • වසර 05 කට වැඩි කාලයක සිට නිරවුල් කර නොතිබුණු පුරනැඟුම ණයහිමි ශේෂය රු.1,324,936 ක් විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |
| • සභාව විසින් අයකරගෙන දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය නොකර රඳවාගෙන තිබුණු මුද්දර බදු වටිනාකම රු.2,089,544 ක් විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |
| • සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වනවිට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් පාරිතෝෂික වටිනාකම රු.913,519 ක් විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළයුතු වේ. | විශ්‍රාම වැටුප් පාරිතෝෂික වටිනාකම පිළිබඳ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙතින් විස්තර ඉල්ලා යවා ඇත. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.182,715,506 ක් වූ ගිණුම් විෂයයන් 19 කට අදාළව පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළයුතු වේ. | පිළිගනිමි. |

1.4 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571(ii) | වර්ෂ 02 ඉක්මවූ වටිනාකම රු.80,500 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 571(ii) ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | කල් ඉකුත් වූ තැන්පතු හිමියන් වෙත එම තැන්පත් ලබා ගන්නා ලෙස දැනුම් දී ඇත. ඉදිරි සති 02 ඇතුලත ආදායමට බැර කිරීමට කටයුතු කරමි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති සංග්‍රහය | | | |
| | පළමු පරිච්ඡේදයේ රීති 5.11 | සභාව සතු මාර්ගස්ථ මුදල් සහ වෙනත් වටිනා භාණ්ඩ සම්බන්ධයෙන් රක්ෂණ ආවරණයක් ලබාගෙන නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | සභාව සතු මාර්ගස්ථ මුදල් හා වෙනත් වටිනා භාණ්ඩ සම්බන්ධයෙන් රක්ෂණ ආවරණය ලබාගැනීමට කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2006 නොවැම්බර් 14 දිනැති අංක PL/07/01/53 දරන පළාත් පාලන අමාත්‍යාංශ ප්‍රතිසංස්කරණ චක්‍රලේඛය<br>------------------------<br>අංක 06 හි 2.2(iii) | අඛණ්ඩව ක්‍රියාත්මක වන මාර්ග නඩත්තු ක්‍රමයක් අනුගමනය කර නොතිබුණි. සභාවට අයත් මාර්ග ගැසට් කර නොතිබුණු අතර ගෙනයා හැකි උපරිම බර ප්‍රදර්ශනය කර නොතිබුණි. | අදාල චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | ග්‍රාමීය කමිටු මගින් යෝජනා කරන මාර්ග සංවර්ධනය කරනු ලබයි. සිතියම් ඇඳීම සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුවන බැවින් මෙම කාර්යය ප්‍රමාද වී ඇත. |

## 02. මූල්‍ය සමාලෝචනය
----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,330,206 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,269,619 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය
----------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්
--------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් ,බිල්කල ආදායම් , රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2019<br>ඇස්තමේන්තුගත ආදායම් | බිල්කල ආදායම | රැස්කල ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018<br>ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | ව්‍යාපාර හා කර්මාන්ත බදු | 4,035,825 | 2,408,210 | 1,694,010 | 714,200 | 1,550,000 | 1,985,775 | 1,985,775 | - |
| (ii) | කඩ කුලී | 21,493,865 | 3,464,747 | 3,094,283 | 441,149 | 426,700 | 387,000 | 316,315 | 70,685 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,228,000 | 1,172,654 | 899,629 | 273,025 | 100,000 | 296,236 | 296,236 | - |
| (iv) | වෙනත් ආදායම් | 13,812,270 | 10,265,602 | 6,806,595 | 4,059,007 | 3,600,000 | 3,600,000 | 3,000,000 | 600,000 |
| | එකතුව | 40,569,960 | 17,311,213 | 12,494,517 | 5,487,381 | 5,676,700 | 6,269,011 | 5,598,326 | 670,685 |

2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගේ සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.4,059,007 ක් හා මුද්දර ගාස්තු රු.32,630,760 ක් විය. | ලැබිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | 2019.12.31 දිනට හිඟ උසාවි දඩ මුදලින් රු.1,576,187 ක් 2020 වර්ෂයේ අයකර ගැනීමට කටයුතු කර ඇත. ඉතිරි මුදල් අයකර ගැනීමට ඉල්ලුම් කර ඇත. |

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය ,පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම , ජනතාවගේ සුබ විහරණය ,පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව වූ නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු නමුත් 2019 දෙසැම්බර් 31 දිනට අදාල කාරණා සම්බන්ධව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය ප්‍රකාරව අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කළයුතු වේ. | පළාත් පාලන අමාත්‍යාංශය විසින් පනවා ඇති අතුරු ව්‍යවස්ථා 42 හා උතුරු මැද පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් පනවා ඇති අතුරු ව්‍යවස්ථා 10 මෙම සභාව විසින් වැළඳගෙන ඇත. |

(ආ) අපේක්ෂිත නිමවුම් මට්ටම (Out Put) ලබානොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වනවිට ක්‍රියාත්මක කර තිබුණු ඇස්තමේන්තුගත වටිනාකම රු.4,504,254 ක් වූ ව්‍යාපෘති 09 ක භෞතික ප්‍රගතිය සියයට 40 සිට සියයට 85 දක්වා විය. | වර්ෂය තුල උපරිම භෞතික ප්‍රගතිය ලබා කරගත යුතුවේ. | මෙම ව්‍යාපෘති නොවැම්බර් දෙසැම්බර් මාස වල ගිවිසුම් අත්සන් කල ව්‍යාපෘති වේ. 2019 නොවැම්බර්, දෙසැම්බර් මාසවල ඇති වූ වර්ෂාව හේතුවෙන් මේ ව්‍යාපෘතිවල අපේක්ෂිත නිමවුම ලබා ගැනීමට නොහැකි විය. |

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කීරික්කුලම ප්‍රදේශයේ කසළ කළමනාකරණ මධ්‍යස්ථානයක් ඉදිකර තිබුණද කසළ එකතු කිරීමේ ක්‍රියාවලියක් සිදුකර නොතිබුණි. | කසළ කළමනාකරණය සඳහා නිසි වැඩ පිළිවෙලක් යෙදිය යුතුවේ. | කසළ ප්‍රතිචක්‍රීයකරණ මධ්‍යස්ථානය විධිමත් කරන තෙක් කසල එකතු කිරීම තාවකාලිකව අත්හිටුවා ඇත. |

3.2 වත්කම් කළමනාකරණය

නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| භාවිතයට නොසුදුසු බවට නිර්දේශ වී ඇති වටිනාකම රු.2,619,050 ක් වූ වාහන 02 ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | භාවිතයට ගත නොහැකි වාහන අපහරණය කළයුතු වේ. | තක්සේරු වටිනාකම ලැබුණු පසු අපහරණ කටයුතු සිදු කිරීමට කටයුතු කරමි. |

3.3 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දේශීය ණය සහ සංවර්ධන අරමුදලෙන් ලබාගෙන තිබුණු ණය මුදලට අදාල වාරික මුදල්, නියමිත කාලය තුළ ගෙවීම් නොකිරීම හේතුවෙන් ප්‍රමාද ගාස්තු ලෙස රු.38,609 ක් ගෙවා තිබුණි. | ණය වාරික සහ පොලිය නියමිත කාලසීමාව තුල ගෙවීමට කටයුතු කළයුතු වේ. | 2018 වර්ෂයේ අග භාගය වන විට සභාවේ උත්පාදිත ආදායම පරිපාලන කටයුතු පවත්වාගෙන යාමටද ප්‍රමාණවත් නොවීය. ඒ හේතුවෙන් ණය වාරික ගෙවීමද ප්‍රමාද විය. |

04. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| උතුරු මැද පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2015 මාර්තු 18 දිනැති අංක 04/2015 දරන චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව සෘජුවම වගකියනු ලබන අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කරගෙන නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාර සෘජුවම වගකිවයුතු ලබන අභ්‍යන්තර විගණන නිලධාරියකු පත්කර වාර්තා ලබාගැනීමට කටයුතු කළයුතු වේ. | අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත් කර තිබුණි. එම නිලධාරිනිය ප්‍රසූත නිවාඩු ලබාගෙන ඇත. එම විෂය ප්‍රධාන කළමනාකරණ සහකාර වෙත පවරා ඇත. |

4.2 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2016 ජනවාරි 28 දිනැති DMA/2009(1)(i) දරන කළමනාකරණ හා විගණන චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | 2020 වර්ෂයේ විගණන කළමනාකරණ කමිටු සභා මට්ටමින් පැවැත්වීමට කටයුතු කර ඇත. |